# ජයවර්ධනපුර සරසවි නව උප කුලපති වැඩ බාර ගනී

(මිහිදිසා දයානන්ද)

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නව උප කුලපති ලෙස හිටපු උප කුලපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා ඊයේ (16) වැඩ බාර ගත්තේය. ඔහු මෙවර කුලපතිධුරයට පත්වූයේ දෙවන වරටය.

සෝරත හිමි පිළිරුව අසලදී ආගමික වතාවත් සිදු කිරීමෙන් අනතුරුව උප කුලපති කාර්යාලයේදී මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනා මධ්‍යයේ අමරතුංග මහතා වැඩබාර ගත්තේය.



ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නව උප කුලපති ලෙස මහාචාර්ය සම්පත් අමරතුංග මහතා වැඩ භාරගත් අවස්ථාව ලේඛකාධිකාරී එල්. එච්.ඩබ්ලිව්. පෙරේරා විශ්වවිද්‍යාලීය ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ ජාතික සංවිධායක රංජිත් ඉද්දමල්ගොඩ, මහාචාර්ය සිරාත් අමරසේකර යන මහත්වරු සහ සම්පත් අමරතුංග මහතා බිරිඳ සහ පුතාද මෙහි වෙති.

(ඡායාරූපය - ඉෂාන් සංජීව)

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සංස්ථාපනය කරන ධාතූන් වහන්සේ සහිත කරඬුව රැක ගන්නා ලෙස විශ්වවිද්‍යාලය රැක ගනිමින් එහි සංවර්ධනයට කටයුතු කරන ලෙස ආශිර්වාද කළ කුලපති මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනුනායකහිමියෝ එම කරඬුව මහාචාර්ය සම්පත් අමරතුංග මහතාට භාරදුන්හ.

එහිදී අනුශාසනාවක් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමියෝ මෙසේ පැවසූහ.

අද ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සෑම විෂය ක්ෂේත්‍රයක්ම ආවරණය කරන පීඨයන් සහිත වැඩිම සිසු සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන සුවිශේෂී විශ්වවිද්‍යාලයක් බවට පත්වී තිබෙනවා. ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී පෙදරේරුවෝ කීප දෙනෙක් සිටියත් ප්‍රධාන පෙදරේරුවා තුළ තමයි ගොඩනැගිල්ලේ සැලැස්ම තිබෙන්නේ. අනෙක් අය කරන්නේ ඔහුගේ උපදෙස් මත ගල් බැඳීමයි. විශ්වවිද්‍යාලයක උප කුලපතිවරයා මත තමයි මේ විශ්වවිද්‍යාලය ඉදිරියට ගෙන යන්නේ කොහොමද යන්න රඳී තිබෙන්නේ. ඒ කාර්යය සාර්ථකව කරන්න අපි එතුමන්ට ආශිර්වාද කරනවා.

මෙම අවස්ථාවට මහා සංඝරත්නයක් විශ්වවිද්‍යාලයේ පීඨාධිපතිවරුන් ඇතුළු ආචාර්ය මණ්ඩලයේ විශාල පිරිසක් එක්ව සිටියහ.